# සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

(මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ)

# පුරප්පාඩු

1980 අංක 46 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කරන ලද සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එමගින් එහි සාමාජිකයින් සඳහා සමාජ ආරක්ෂණය සපයනු ලැබේ. එය රටේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල වේ. මෙහි අරමුදල් පදනම රු. බිලියන 450 ඉක්මවන අතර දිවයින පුරා මෙහි ප්‍රාදේශීය කාර්යාල 19 ක් පවත්වාගෙන යනු ලැබේ. වර්තමානයේ, අරමුදලේ දායක සාමාජිකත්වය ආසන්න වශයෙන් මිලියන 2.8 ක් වන අතර සේවා යෝජකයින් 83,000 ක් ආවරණය කෙරේ.

පහත පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වන සුදුසුකම්ලත් වෘත්තිකයන් බඳවා ගැනීමට මණ්ඩලය අපේක්ෂා කරයි.

01.

| තනතුර | සුදුසුකම් සහ පළපුරුද්ද |
|---|---|
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) - (HM 1-3)**<br>(පුරප්පාඩු සංඛ්‍යාව-1) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ/ගිණුම්කරණය හෝ මූල්‍ය යන විෂයධාරා වලින් ප්‍රථම උපාධිය ලබා සිටීම සහ අදාළ විෂය ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සාමාජිකත්වය ලබා සිටීම සමග රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 18 ක පළපුරුද්දක් තිබීම හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය.<br><br>CFA සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. |
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා) - (HM 1-3)**<br>(පුරප්පාඩු සංඛ්‍යාව-1) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් කළමනාකරණවේදී / විද්‍යාවේදී (විද්‍යා විෂය ධාරාව) / ශාස්ත්‍රවේදී / වාණිජවේදී / සමාජවිද්‍යාවේදී / විද්‍යාවේදී (රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය) මානව සම්පත් කළමනාකරණය යන විෂයන්ගෙන් ප්‍රථම උපාධියක ලබා තිබීම සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සමග රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 18 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් වසර 03ක් පළපුරුද්දක් තිබිය යුතුය. |
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) - (HM 1-3)**<br>(පුරප්පාඩු සංඛ්‍යාව-1) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය යන විෂයන්ගෙන් ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සමග රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 18 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් වසර 03ක් පළපුරුද්දක් තිබිය යුතුය. |
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) - (HM 1-3)**<br>(පුරප්පාඩු සංඛ්‍යාව-1) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිවේදී උපාධිය සමඟ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වීම සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සමඟ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 18 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් වසර 03ක් පළපුරුද්දක් තිබිය යුතුය. |

02.

| තනතුර | සුදුසුකම් සහ පළපුරුද්ද |
|---|---|
| **සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) - (HM 1-1)**<br>(පුරප්පාඩු සංඛ්‍යාව-1) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් කළමනාකරණවේදී / විද්‍යාවේදී (විද්‍යා විෂය ධාරාව) / ශාස්ත්‍රවේදී / වාණිජවේදී / සමාජවිද්‍යාවේදී / විද්‍යාවේදී (රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය) මානව සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍ර වලින් ප්‍රථම උපාධිය ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සමඟ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 10 ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. |
| **සහකාර සාමාන්‍යාධිකාරී (ක්‍රියාත්මක කිරීම) - කලාප 2 - (HM 1-1)**<br>(පුරප්පාඩු සංඛ්‍යාව-1) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් කළමනාකරණවේදී / විද්‍යාවේදී (විද්‍යා විෂය ධාරාව) / ශාස්ත්‍රවේදී / වාණිජ්‍යවේදී / සමාජවිද්‍යාවේදී / විද්‍යාවේදී (රාජ්‍ය පරිපාලනය ව්‍යාපාර පරිපාලනය) මානව සම්පත් කළමනාකරණය යන විෂයන්ගෙන් ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සමඟ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 10 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු ය. |
| **සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) - (HM 1-1)**<br>(පුරප්පාඩු සංඛ්‍යාව-1) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජවේදී / ගණකාධිකරණය / මූල්‍ය විෂය ධාරාව වලින් ප්‍රථම උපාධිය ලබා තිබීම සමඟ රජයේ අදාල විෂය ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සමඟ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වශයෙන් වසර 10 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු ය. |

03.

| තනතුර | සුදුසුකම් සහ පළපුරුද්ද |
|---|---|
| **නීති නිලධාරී - (JM 1-1) (අධ්‍යක්ෂක මණ්ඩල ලේකම් ලෙස)**<br>(පුරප්පාඩු සංඛ්‍යාව-1) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක / ආයතනයක නීතිවේදී (LLB) උපාධිය හෝ නීතිඥවරයෙකු වීම. |

**වැටුප් පරිමාණය**

**HM 1-3** - රු. 86,865/-15x2,270 = රු. 120,915/- (ආරම්භක වැටුප් ලක්ෂය - රු. 86,865/-)

**HM 1-1** - රු. 80,295/-15x2,270 = රු. 114,345/- (ආරම්භක වැටුප් ලක්ෂය - රු. 80,295/-)

**JM 1-1** - රු. 42,600/- +10x 755/- + 18 x 1,135 = 70,580/- (ආරම්භක වැටුප් ලක්ෂය - රු. 42,600/-)

**වයස් සීමාව:**

**HM 1-3 සහ HM 1-1:** සඳහා : වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**JM 1-1** සඳහා : වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ නිර්ණායක: ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය**

**ඉහත තනතුරු සඳහා හිමි වෙනත් ප්‍රතිලාභ**

- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුව **HM 1-3** සහ **HM 1-1** තනතුරු සඳහා රියදුරුවරයෙක් සමග වාහනයක් සහ ඉන්ධන දීමනාව හෝ, තමන්ගේම වාහනයක් භාවිතා කිරීම සඳහා වාහන දීමනාවක්
- ණය පහසුකම්
- භාණ්ඩාගාර අනුමැතියට යටත්ව වාර්ෂික ප්‍රසාද දීමනාවන්
- වෛද්‍ය රක්ෂණාවරණය

තෝරාගත් අයදුම්කරුවන්ට රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ සමාන තත්ත්වයේ රාජ්‍ය ආයතන විසින් භුක්ති විඳින අනෙකුත් අතුරු ප්‍රතිලාභ හිමිවේ.

නිර්දේශ සඳහා ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ඔවුන් සම්බන්ධ කර ගතහැකි තොරතුරු ඇතුළත් ජීව දත්ත පත්‍රිකාවක් සහිත අයදුම්පතක්, අදාළ සහතිකවල පිටපත් සමග **2023.04.06** දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩලවල සේවය කරන සේවකයින්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහුව/ඇයව නිදහස් කළ හැකිද යන්න සඳහන් කළ යුතුය.

**සභාපති - ප්‍රධාන විධායක නිලධාරී**

**සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**

**තැ.පෙ. 807, 23 වන මහල, මෙහෙවර පියෙස, නාරාහේන්පිට,**

**කොළඹ 05.**